**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 11/95**

මගේ අංකය: III/0266/2/68(පොදු) -
එල්.එච්.ඒ.(II) තාව.
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.03.16 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ ණයදීමේ සාමාන්‍ය කොන්දේසි හා වැටුප් ණය/ අත්තිකාරම් අනුමත කරන බලධාරීන් සංශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදයේ **3:7** වගන්තිය හා **5** වැනි වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරෙන අතර, 1990.01.17 දිනැති අංක 03/90 රා.පරි.චක්‍රලේඛය මෙයින් අවලංගු කෙරේ.

02. " 3:7 - ණය මුදල ආපසු අයකර ගැනීම ආරම්භ කලයුත්තේ ණය මුදල දෙන ලද මාසය එක්කම ඊළඟ මාසයේ සිටය. ණය මුදල ගෙවන ලද දිනයේ සිට නියමිත ප්‍රමාණයට පොලිය අයකර ගතයුතුය."

03. <u>05 - ණය අනුමත කරන නිලධාරීන්,</u>

i. නිවාසයක් තැනීම සඳහා ඉඩමක් හෝ නිවාස දේපලක් හෝ මිලට ගැනීම සහ නිවසක් ඉදිකිරීම/වැඩ අවසන් කිරීම සඳහා ණය - (ii වගන්තිය)
අමාත්‍යාංශ ලේකම්/අමාත්‍යාංශ අතිරේක ලේකම්.

ii. ණයගැතිභාවයෙන් මිදීම සඳහා ණය - (12 වගන්තිය)
අමාත්‍යාංශ ලේකම්/අමාත්‍යාංශ අතිරේක ලේකම්.

iii. මෝටර් වාහනයක් මිලදී ගැනීම සඳහා ණය - (වගන්ති 7 හා 8)
අමාත්‍යාංශ ලේකම්/අමාත්‍යාංශ අතිරේක ලේකම්.

iv. අනිකුත් සියළුම ණය - දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු මු.රෙ. 135 යටතේ තම කාර්යයන් පවරා ඇති නිලධාරියකු.

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය